# අධ්‍යාපන සංවර්ධන "තත්ත්ව කව" පිහිටුවීම
# සංකල්ප පත්‍රිකාව

## තාර්කිතය (Rational)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සබරගමුව පළාත තුළ ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් විවිධ අංශ, විවිධ විෂය හා විවධ අධ්‍යක්ෂවරු යටතේ ක්‍රියාත්මක වීමේදී මතු සඳහන් ගැටලු මතු වී ඇත.

- එක් අරමුණකට අදාළ විෂය කොටස් වෙන වෙනම ඉටුවීම.
- එක් විෂයකට අදාළ ක්‍රියාකාරකම් විවිධ නිලධාරින් යටතේ ඉටු වීම.
- විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟ ක්‍රියාත්මක කරන වැඩසටහනක් එක් අරමුණක් වෙනුවෙන් සංවිධානය නොවීම.
- විවිධ වැය ශීර්ෂ යටතේ වෙන් වී ඇති අරමුදල් නිසි සම්බන්ධීකරණයක් සහිතව නිසි ලෙස සාකච්ඡා නොවීම.
- සියලුම ක්‍රියාකාරකම් එකට සම්බන්ධීකරණය නොවීම.

මෙම ගැටලු අවම කිරීම සඳහා "අධ්‍යාපන සංවර්ධන තත්ත්ව කව"*(අධ්‍යාපන සංවර්ධන සංසද)* පිහිටුවීම මඟින්, එම ගැටලු අවම කර ගනිමින් විවිධ අංශ, ඒකක, වැයශීර්ෂ යටතේ සිදුවන ආයෝජන එක් ඉලක්කයකට යොමු කිරීමටත්, එමඟින් කාලය, ධනය, ශ්‍රමය නාස්තිය නැවතීමට කටයුතු කිරීමටත්, විවිධ වෘත්තිය පාර්ශව වල අදහස් ලබා ගනිමින් කටයුතු කිරීම මත වඩාත් ඵලදායි ලෙස ක්‍රියාකාකරම් සංවිධානයට හා ක්‍රියාත්මක කිරීමටත්, අධීක්ෂණය ඇගයීම, පහසුවෙන් සිදු කර නිසි මඟ පෙන්වීම් ලබා දීමටත් හැකි වනු ඇත

# අරමුණු

I. සමාන ඉලක්ක කරා ක්‍රියාත්මක වැඩසටහන් අතර සම්බන්ධීකරණයන් ගොඩනැගීම.
II. සමාන ඉලක්ක සහිත වැඩසටහන් සඳහා දායක වන සියලුම පාර්ශව වල අදහස් හා යෝජනා ලබාගැනීම.
III. සමස්ත වැඩසටහන් නියාමනය විධිමත් කිරීම හා මහපෙන්වීම් සරල කිරීම.
IV. වෘත්තිය විශේෂඥ සහය ලබාගැනීම හා වෘත්තිය සංවර්ධනය.
V. කළමනාකරණය සරල කිරීම හා විවෘත හා විනිවිද ප්‍රවේශ නිර්මාණය

# ක්‍රමවේදය හා කාලරාමුව

I. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුළ අධ්‍යාපන සංවර්ධන සංසද *(තත්ත්ව කව)* 10ක් පිහිටුවීම *(2021 නොවැම්බර්)*

*II. එම සංසද වල කාර්යභාර හඳුනා ගැනීම.*

III. සංසද වල ප්‍රථම රැස්වීම පැවැත්වීම හා 2021-2022 වැඩසටහන නිර්මාණය *(2021 දෙසැම්බර්)*

IV. ලබාදෙන මඟපෙන්වීම් අනුව සංසද කටයුතු ක්‍රියාත්මක කිරීම *(2021-2022)*

# දැනට ලබා ඇති ප්‍රගතිය

I. සංසද 10ට අදාළ සංසද පිහිටුවීම හා සංයුතිය සැකසීම නිම කර ඇත/ ක්‍රියාත්මක වේ.
II. Online රැස්වීම් සඳහා මූලික හමුවීම සඳහා අවශ්‍ය සටහන් හා පහසුකම් ලබා දීම.